Embassy of the United States of America

Colombo

# PRESS RELEASE

Public Affairs Section

Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070

Email: shenjy@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20160520S

## ආපදා සහන කටයුතු සඳහා අමෙරිකාවෙන් කඩිනම් උපකාර

2016 මැයි 20: ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානයන්හි ජල ගැලීම් සහ නාය යෑම් වලින් විපතට පත් අයගේ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය හදිසි මානුෂීය සහනාධාර ලෙස ඇමෙරිකා එක්සත් ජනපද රජයෙන් රුපියල් මිලියන 7.2ක් (ඇ. ඩො. 50,000) සපයා ඇත. මීට අදාළව ඉතාමත් හදිසි අවශ්‍යතා සඳහා දායක වීමට අන්තර් ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ආයතනය ශ්‍රී ජාතික ආපදා සහන සේවා මධයස්ථානය, ශ්‍රී ලංකා හමුදාව සහ අනෙකුත් අන්තර් ජාතික ආධාර ආයතන සමග සමීපයෙන් කටයුතු කරයි.

උණුසුම් පොරෝන, සනීපාරක්ෂක කට්ටල, පාවහන්, මෙට්ට, ඇඳුම් යන අවශ්‍යතා සපුරාලීමට මෙම ඇමෙරිකානු ආධාර භාවිතා වනු ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා රජයේ බලධාරීන් විසින් කරනු ලබන පුළුල් මෙහෙයුම් කාර්යයන් සඳහා තවදුරටත් සහාය විය හැකි ආකාරය පිලිබඳව තානාපති කාර්යාලය නිරතුරුවම ඔවුන් සමග අදහස් හුවමාරු කර ගනිමින් සිටියි.

"නාය යාම සහ ජල ගැලීම් නිසා විපතට පත් වූවන් යථා තත්වයට පැමිණීමට කඩිනම් සහ දීර්ඝ කාලීන වශයෙන් සහනාධාර අවශ්‍ය බව අපි දනිමු. අද ප්‍රකාශිත මෙම ආධාර මගින් එම ස්ථාන වල අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීමට හැකි වනු ඇත. විපතට පත් වී ඇති දරුවන්, කාන්තාවන් සහ පවුල් වලට මෙම ප්‍රදානයෙන් සහනයක් ලැබෙනු ඇත. අපි අපේ සහයෝගය ඉදිරියටත් දීමට කැප වී සිටිමු." යැයි ඇමෙරිකානු තානාපති අතුල් කෙෂප් මහතා පැවසීය.